## 2 පරිච්ඡේදය

# පොළොන්නරු කතිකාවතට මුල් වූ දේශපාලන සහ ආර්ථික පසුබිම

පොළොන්නරු කතිකාවත පිහිටුවන ලද්දේ මහාපරාක්‍රමබාහු රජු විසින් සංඝ සාමග්‍රිය සිදු කළ පසුයි. සංඝ සාමග්‍රියෙන් පසු සිල්වත් භික්ෂු පිරිසක් ඇති වූ හ. කතිකාවත පිහිටුවීමෙන් බලාපොරොත්තු වූයේ එම භික්ෂූන් සහ අනාගත භික්ෂූන් (මතුවන සංඝයා ද) අප්‍රතිපත්ති, දුෂ්ප්‍රතිපත්තිවලින් වළකා යහපත් භික්ෂු සමාජයක් ඇති කොට ශාසනය චිරාත්කාලයක් පැවතෙන හැටියට පිළියම් යෙදීම ය. කතිකාවත පිහිටුවීමට පළමු සංඝ සාමග්‍රියක් කිරීමට එක් හේතුවක් වූයේ ඒ වනවිට බොහෝ භික්ෂූන් අප්‍රතිපත්ති, දුෂ්ප්‍රතිපත්තිවල නියැලී සිටීම ය. මේ පරිච්ඡේදයෙන් සාකච්ඡා කෙරෙන්නේ සංඝ සාමග්‍රියට පෙර භික්ෂූන් අතර අප්‍රතිපත්ති, දුෂ්ප්‍රතිපත්ති බහුල වීමට දේශපාලන සහ ආර්ථික බලපෑම් කොතරම් දුරට හේතු වී ද යන කාරණයයි.

ක්‍රි.ව. 992-993 දී පමණ සොළීන් ලංකාව යටත් කරගැනීමට ආක්‍රමණ කරන්නට වූ තැන් සිට ලක්දිව ඇති වූ දේශපාලන වියවුල් බුදු සසුනේ පිරිහීම ඇති කළ ප්‍රධාන හේතුවක් හැටියට සැලකිය හැකි ය. දේශපාලන වියවුල් ඊටත් පෙර සිට දැනෙන්නට වූ නමුත් ඒවා දැඩිවන්නට වූයේ 1 රාජරාජ නම් සොළී රජුගේ (ක්‍රි.ව. 985-1014) ආක්‍රමණ[1] ඇති වූ කාලයේ සිට ය. එතැන් සිට මහාපරාක්‍රමබාහු රජු යටතේ ලංකාව එක්සත් වී දේශපාලන ස්ථාවර භාවයක් ඇතිවන තුරු පැවති වකවානුව, ප්‍රධාන වශයෙන්, කාලපරිච්ඡේද දෙකකට බෙදා දැක්විය හැකි ය. ඉන් මුල් කාලපරිච්ඡේදය සොළීන් විසින් ලංකාව යටත් කර ගැනීමට ආක්‍රමණ මෙහෙය වූ අවස්ථාවෙන් ඇරඹී 1 විජයබාහු (ක්‍රි. ව. 1055-1110) රජු විසින් ලංකාව සොළී ආධිපත්‍යයෙන් මුදවා ගැනීම දක්වා පැවතිණ. I විජයබාහු රජුගේ අභාවයෙන් ඇරඹී මහාපරාක්‍රමබාහු රජු ලංකාව එක්සේසත් කරන තුරු ගත වූ කාලය දෙවැන්න හැටියට දළ වශයෙන් බෙදා දැක්විය හැකි ය.

යට දක්වන ලද පළමුවන කාලපරිච්ඡේදය තුළ පැවති දේශපාලන තත්ත්වය සැකෙවින් විමසා බැලිය යුතු ය. ක්‍රි.ව. 993 දී පමණ චෝළ 1 රාජරාජ විසින් ලංකාවේ උතුරු ප්‍රදේශය යටත් කිරීමෙන්[2] ඇරඹුණු සොළී ආක්‍රමණ 1 රාජේන්ද්‍ර (ක්‍රි.ව. 1012-1044) රජු විසින් ක්‍රි. ව. 1017 දී කරන ලද ආක්‍රමණයෙන් ලක්දිව රජ කළ V මිහිඳු (ක්‍රි. ව. 982-1029) රජු ජීවග්‍රාහයෙන් අල්ලාගෙන,[3] ඇතැම් විට රුහුණ පමණක්

---

1. රාය, හේමචන්ද්‍ර, ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, 1 කා. 1 භා. (විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ සිංහල පරිවර්තනය) 1964. 337, පි. (ලංවිලංඉ.)
2. **UCHC**.Vol.I, pt.I,p. 349: **ලංවිලංඉ**. 1 කා. 1 භා. 337 පි.
3. එම 350 පි.